රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.327 (iii)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1986 ජූලි මස 17 වැනිදින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1986 නව වැටුප් - වැටුප් පරිමාණයන්හි උපරිමයේ රැඳීසිටීමේ සීමාවන් ඉවත් කිරීම - 1986.05.02 දිනැති අංක 327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන**

1986.05.02 දිනැති අංක 327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

02. 8(1) ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

"1986 ජනවාරි මස 01 වැනි දිනට පෙර නිලධාරියෙකුට අදාල වූ වැටුප් පරිමාණයේ කාර්යක්ෂමතා කඩඉම් ඉක්මවා යාම සඳහා ලැබී තිබුණු කාලපරිච්ඡේදයෙහි අඩුවීමක් සිදු නොවන ආකාරයට, 1986 නව වැටුප් යටතේ, බඳවා ගැනීමේ පරිපාටියක/සේවා ව්‍යවස්ථාවක, අදාල වැටුප් පියවරයන්හි කාර්යක්ෂමතා කඩඉම් නියම කළ යුතුය. බඳවා ගැනීමේ පරිපාටි සහ සේවා ව්‍යවස්ථා මෙම අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතුය. වැටුප් පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මතුවන යම් ගැටළු වේතන් ආයතන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය."

03. නිලධාරියෙකුගේ වැටුප් වර්ධක දිනය 1986.01.01 දිනට යෙදේ නම්, එබඳු නිලධාරියෙකුට පළමුකොට ඔහු උපයාගත් වැටුප් වර්ධකය ලබා දී, අනතුරුව වැටුප් පරිවර්තනය කළ යුතුය.

Siriwardhana
ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පු/-16